**තුනුක්කායි ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 මැයි 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
---------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

වර්ෂ තුනකට වැඩි කාලයක සිට පරිත්‍යාග කරන ලද වාහන පහකට අදාළ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

#### 1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

වර්ෂ 05 කට පෙර විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව ඇති රු.35,607 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත අවස්ථාවන් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | (I) පරිච්ඡේදය 11 රීතිය 66 | එකතුව රු.1,856,398 ක හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| | (II) පරිච්ඡේදය 111 රීතිය 33 | සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් බදු සඳහා තක්සේරු සිදුකර නොතිබුණි. |
| | (III) පරිච්ඡේදය 111 රීති 59 සහ 60 | සමාලෝචිත වර්ෂය තුළදී වෙළඳ බදු සඳහා තක්සේරු සිදුකර නොතිබුණි. |
| | (IV) පරිච්ඡේදය 111 රීතිය 108 | තුනුක්කායිවල ඉදිකරන ලද ළමා උද්‍යානය නඩත්තු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | (V) පරිච්ඡේදය 1V රීතිය 180 | මුදල් හා තොග භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය. | සභාව සතු වාහන 09 සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | 5.4.12 වගන්තිය | එකතුකළ අගය මත බදු (VAT) සභාව විසින් ගෙවීමෙන් අනතුරුව ඒ පිළිබඳ විස්තර එළඹෙන ලේකම්වරයාගේ 15 දින හෝ එයට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාට දැන්විය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

----------------------------------------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි අංක 571 | වර්ෂ දෙකක් ඉක්මවා ඇති එකතුව රු.921,780 ක් වන කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය විග්‍රහය**

-------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.11,428,845 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.7,481,955 ක් වූයෙන් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,946,890 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. පුනරාවර්තන ප්‍රදාන වර්ධනය වීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුන් වී තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,106,817 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර එය පෙර වර්ෂයේ අනුරූප ශුද්ධ අතිරික්තය වන රු.4,307,112 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,799,705 කින් වර්ධනය වී තිබුණි.

**2.3 මූල්‍ය සමාලෝචනය**

-------------------------

**කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

---------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.34,615,160 ක් වූ අතර එය පෙර වර්ෂයේ කාරක ප්‍රාග්ධනය වූ රු.23,778,019 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.10,837,141 ක වැඩිවීමක් සිදු වී තිබුණි.

**2.4 ආදායම් පරිපාලනය**

-----------------------

**2.4.1 වරිපනම් සහ බදු**

-----------------

1988 (මූල්‍ය සහ පරිපාලන) රීතින්වල III පරිච්ඡේදයේ 32 වන රීතිය අනුව වරිපනම් සහ බදු සම්බන්ධයෙන් වූ ලේඛනය නඩත්තු කර නොතිබුණි.

**2.4.2 විදුලි සංදේශන කුළුණු සඳහා ගාස්තු අයකිරීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ කර තිබූ විදුලි සංදේශ කුළුණු 02 ක් සම්බන්ධයෙන් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමට මූලික සැලසුම් සකස් කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතීන් ලබාදීම යන හතර ආකාරයේ ගාස්තු තක්සේරු කර කළ යුතු අතර ඒවා අයකර ගෙන ගිණුම්වලට ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ප්‍රදානය කරන ලද වාහන 10 ක අයිතිය ලබාගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 14 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජල පිරිපහදු කිරීමේ කාර්ය සඳහා 2013 වර්ෂයේදී යුනිසෙෆ් (UNICEF) ආයතනයෙන් රු.916,045 ක පරිත්‍යාගයක් ලැබී තිබුණද අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා නොකර විවිධ තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

-------------------------

මුදල් රෙගුලාසි අංක 756 හා අංක 757 නියමයන් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ එම වාර්තා සකස්කර නොතිබුණි.

### 3.3 අත්හැර දමන ලද ව්‍යාපෘති

--------------------------

එකතුව රු.2,672,500 කට ඇස්තමේන්තු කර ඇති මූලධන වැඩ 19 ක් සමාලෝචිත වර්ෂයේදී අත්හැර දමා තිබූ අතර එයට හේතුන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව ප්‍රජා මූල සංවිධානවලට කොන්ත්‍රාත් වැඩ සෘජුවම ලබාදී තිබුණි. වැඩ සම්බන්ධ ප්‍රගති වාර්තා විගණනය විසින් ඉල්ලා තිබුණද ඒවා ඉදිරිපත් නොකරන ලදී.

### 3.5 ප්‍රමාද වී ඇති ව්‍යාපෘති

-----------------------

එකතුව රු.8,245,883 ක් වන ව්‍යාපෘති 19 ක් සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කර තිබූ අතර මෙම වැඩවල වටිනාකම වියදම් වශයෙන් පෙන්නුම් කර තිබූ අතර විවිධ ණයහිමි ගිණුමට බැරකර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම වැඩ නිම කිරීමට කටයුතු කර නොතිබුණි

### 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැලි කසල පිළිස්සීම සහ පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණු අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන් අනුගමනය කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

ඵලදායී යාන්ත්‍රනයක් වශයෙන් භාවිතය සඳහා උපයෝගී කර ගැනීම පිණිස අයවැය ඇස්තමේන්තු සකස්කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර රු.80,250 සිට රු.4,074,016 ක පරාසයක විචලනය වී තිබූ අතර අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් රු.59,617 සිට රු.6,132,920 ක පරාසයක විචලනය වී තිබුණ බව නිරීක්ෂණය විය.

### 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල වකවානුවක් සභාව විසින් සකස්කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට හෝ සභාවේ කටයුතු විගණන ඒකකය මගින් ඵලදායී ආකාරයෙන් පරීක්ෂා කිරීම සඳහා විගණන ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජුනි 09 දින හා DMA/2009(1) අංක දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී කිසිඳු රැස්වීමක් පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

i. ආදායම් රැස්කිරීම
ii. ස්ථාවර වත්කම්
iii. ගිණුම්කරණය
iv. සේවක සංඛ්‍යාව
v. වාහන උපයෝජනය
vi. විවිධ තැන්පත්
vii. අයවැය පාලනය
viii. ගබඩා පාලනය
ix. ප්‍රසම්පාදන ක්‍රියාවලිය